




2009 ඔක්තෝම්බර් 25 වෙනි දින බ්‍රිම්බෑන්ක් කවුන්සිලය විසින් පවත්වන ලද Funtasia ළමා වැඩ සටහන වෙනුවෙන් අභින නර්ථනායතනයෙන් ඉදිරිපත් කළ නර්ථන අංගයේ අවස්ථාවක්



ප්‍රවීණ මාධ්‍යවේදී ගාමිණී පොන්සේකා මහතා පසුගියදා සම්මානය ලබාගත් අයුරු

11 වන පිටුවෙන් (සංක්‍රමණිකයා)

මංගල. ඔහු නැත්නම් විපක්ෂයට හඬක් නැති ගානයි. මංගලලාගේ ටැක්ටික්ස් එක්ක හැරෙන්නවත් රනිල්ලට බැහැ. 94 පාද යාත්‍රා ගියපු පරණ පොරවල් අතුගාලා චන්ද්‍රිකාව පුටුවේ ඉන්දුවේ කවුද? 2005 දී කොච්චර කැපිලි තිබුණත් මහින්ද පුටුවේ ඉන්දුවේ කවුද? මංගලලා ටිරාන්, ශ්‍රීපතිලා ද්‍රවිඩ සගයොත් එක්ක ගහපු ගැටේ නැත්නම් ජේ.වී.පී. එකට තනියෙන් ඒ ගේම දෙන්න පුළුවන්ද? සේරම කරලා එළියට විසිවෙලා ඉන්න මංගල දැන් තනියම දෙන සටනේ ප්‍රමාණය රජවෙලා හිටපු මහින්ද ගැලවුම්කාරයෙක් දක්වා පල්ලම් බැසීමෙන් හිතා ගන්න පුළුවන්. අපි මංගලගේ දේශපාලනයත් සමඟ එකඟ නැහැ. ඒත් කවුරුන් හෝ ආණ්ඩුවේ මේ තනි ගමනට එරෙහිව නැගී සිටිය යුතුයි. එතනදී අපි සාධාරණ කරුණුවලදී මංගල සමඟ එකඟයි. එසේ නොවුනහොත් ආණ්ඩුවේ මේ ගමන නවතින්නේ කොතනද කියා මහින්දවත් දන්නේ නැතුව ඇති.

**සරත් ගැන -** සරත් ෆොන්සේකා නැමැති හිටපු යුධ හමුදාපතිවරයාට අපි ගෞරව කරන්නේ යුධ නායකයෙක් ලෙසයි. ඔහු අවංක දක්ෂ හොඳ මිනිසෙක් වෙන්න ඇති. ඒත් හමුදාපතිවරයෙක් රටේ නායකත්වයට පත් වෙනවට අපේ කැමැත්තක් නැහැ. ඒ සරත් ෆොන්සේකාට ඇති අකමැත්ත නිසා නොවේ. විනයෙන් පමණක් සියලු ප්‍රශ්න විසඳීමට නොහැකි බව අපට දැනෙන නිසයි. ඒ නිසා ඒ ගැන ඇති.

